2 පෘථිවියේ ප්‍රධාන භෞතික ලක්ෂණ

පෘථිවියේ ප්‍රධාන භෞතික ලක්ෂණ (physical charateristics) ලෙස භූ විෂමතාව (relief) හා දේශගුණය දැක්විය හැකි ය. භූ විෂමතාව යනු පෘථිවිතලය මත භූ රූපණයේ විවිධත්වය යි. පෘථිවිය විවිධ භූ රූපවලින් සමන්විත වන අතර එවැනි භූ රූප ලක්ෂණ විශාල සංඛ්‍යාවක් පෘථිවිතලය මත දක්නට ලැබේ. කඳු, කඳුවැටි, සානු, තැනිතලා ඒවාට නිදසුන් වේ. එමෙන් ම පෘථිවියේ දේශගුණික විවිධත්වයක් ද පවතී.

පෘථිවියේ භූ විෂමතාව, ප්‍රධාන දේශගුණ වර්ගවල ස්වභාවය සහ ව්‍යාප්තිය පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම පාඩමේ අරමුණ වේ.

පෘථිවියේ භූ රූප ලක්ෂණ පරිමාණයෙන් එකිනෙකට වෙනස් වන අතර පරිමාණය අනුව විශාල ම භූ රූප වන්නේ, මහාද්වීප සහ සාගර ය. විශාල පරිමාණ භූ රූප ලක්ෂණ තුළ ඊට වඩා පරිමාණයෙන් කුඩා භූ රූප ලක්ෂණ රාශියක් දක්නට ලැබේ.

මහාද්වීප (Continents)

පෘථිවියේ මුළු භූමි ප්‍රමාණයෙන් 29%ක් ගොඩබිම් ය. එම ගොඩබිම් මහාද්වීප හා දූපත් ලෙස පිහිටා ඇත. සාගර ජල තලයෙන් ඉහළට නැගුණු විශාල භූමි ස්කන්ධ මහාද්වීප නම් වේ. එවැනි මහාද්වීප හතකි. එම මහාද්වීපවල විශාලත්වය පිළිබඳ තොරතුරු 2.1 වගුවෙහි දැක්වේ.

2.1 වගුව

මහාද්වීපවල විශාලත්වය

මහාද්වීපය	විශාලත්වය km^2	මුළු ගොඩබිම් ප්‍රමාණයෙන් ප්‍රතිශතය %
ආසියා මහාද්වීපය	43,820,000	29.5%
අප්‍රිකා මහාද්වීපය	30,370,000	20.4%
උතුරු ඇමරිකා මහාද්වීපය	24,490,000	16.4%
දකුණු ඇමරිකා මහාද්වීපය	17,840,000	12.0%
ඇන්ටාක්ටික් මහාද්වීපය	13,720,000	9.2%
යුරෝපා මහාද්වීපය	10,180,000	6.7%
ඕස්ට්‍රේලියා මහාද්වීපය	9,085,000	5.8%

මූලාශ්‍රය - *www.wikipedia.org*



2.1 සිතියම

ලෝකයේ මහාද්වීප සහ දූපත්

මහාද්වීපික මායිමේ සිට සාගරය දෙසට පැතිරී ගිය නොගැඹුරු මුහුදු තීරය, මහාද්වීපික තටකය (continental shelf) නම් වේ. සෑම මහාද්වීපික මායිමක ම මහාද්වීපික තටක දක්නට නැත. මහාද්වීපික තටකය කෙළවර එකවර ම සාගරයට බෑවුම් වන අතර එය මහාද්වීපික බෑවුම නමින් හැඳින්වේ.



2.1 රූපය
මහාද්වීපික තටකය සහ මහාද්වීපික බෑවුම
මූලාශ්‍රය -*http://www.studyblue.com/13/03/2014*

දූපත් (Islands)

දූපත් යනු ජලයෙන් වට වූ විවිධ හැඩයෙන් යුත් කුඩා ගොඩබිම් ය. බොහෝ දූපත් මහාද්වීපවලට ආසන්න ව මහාද්වීපික තටක තුළ පිහිටා ඇත.

ආසියා මහාද්වීපික තටකය තුළ පිහිටි - බෝර්නියෝ, ජාවා, සුමාත්‍රා, ශ්‍රී ලංකාව වැනි දූපත්

ඕස්ට්‍රේලියා මහාද්වීපික තටකය තුළ පිහිටි - පැපුවා නිව්ගිනියා, තස්මේනියා දූපත්

අප්‍රිකා මහාද්වීපික තටකය තුළ පිහිටි - මැඩගස්කරය වැනි දූපත්

නිදසුන් ලෙස දැක්විය හැකි ය.

සාගර මධ්‍ය ප්‍රදේශවල ද දූපත් පිහිටා ඇති බව ලෝක සිතියමක් හෝ ආදර්ශ ගෝලය නිරීක්ෂණය කිරීමෙන් ඔබට දැකගත හැකි වනු ඇත. ගැඹුරු සාගරයේ යමහල් (volcano) ක්‍රියාකාරිත්වය මගින් ඇති වූ හවායි, අයිස්ලන්තය වැනි දූපත් ඒවාට නිදසුන් වේ.

ක්‍රියාකාරකම්

1. මහාද්වීපික තටකය සහ මහාද්වීපික බෑවුම යනු කුමක්දැයි රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.
2. ලෝක ආකෘති සිතියමක විවිධ ප්‍රමාණයේ දූපත් දහයක් සහ ශ්‍රී ලංකාවේ සිතියමක ශ්‍රී ලංකාවට අයත් කුඩා දූපත් පහක් ලකුණු කොට නම් කරන්න.

පැවරුම්

1. සිතියම් පොතක් ආධාර කර ගනිමින් ලෝකයේ පිහිටා ඇති දූපත් හඳුනාගෙන ලේඛනයක් සකස් කරන්න.
2. කිසියම් රටක් දූපතක් ලෙස පිහිටීමෙන් ඇති වන වාසි සහ අවාසි වගුගත කරන්න.

සාගර (Oceans)

පෘථිවි ගෝලය මත ව්‍යාප්ත ව ඇති කරදිය පිරුණු විශාල ජල ප්‍රදේශ සාගර යනුවෙන් හැඳින්වේ. පෘථිවි තලයෙන් 71%ක් මහා සාගරයෙන් වැසී ඇත. එවැනි සාගර පහක් තිබේ. (2.2 සිතියම) එම සාගර, විශාලත්වය අනුව 2.2 වගුවෙහි දැක්වේ. ඇතැම් සාගරවල ඉතා ගැඹුරු සාගරික අගාධ (trenches) පිහිටා ඇත. (2.2 රූපය) මරියානා අගාධය (ගැඹුර 11035m), මින්ඩනාඕ අගාධය (ගැඹුර 10497m) නිදසුන් ලෙස දැක්විය හැකි ය. මෙම අගාධ බොහොමයක් පැසිෆික් සාගරයේ පිහිටා තිබේ.

2.2 වගුව

සාගර සහ ඒවායේ විශාලත්වය

සාගරය	විශාලත්වය km^2
පැසිෆික් සාගරය	155 557 000
අත්ලාන්තික් සාගරය	76 762 000
ඉන්දියන් සාගරය	68 556 000
දක්ෂිණ සාගරය	20 337 000
ආක්ටික් සාගරය	14 056 000

මූලාශ්‍රය - *www.worldatlas.com*



2.2 රූපය

සාගර පත්ලේ ලක්ෂණ කිහිපයක්

මූලාශ්‍රය - *http:jwilson.wikidot.com/13/03/2014*

මුහුදු (Seas)

ගොඩබිම්වලින් සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් වට වූ හෝ සාගරවලට සම්බන්ධ වූ කරදිය ප්‍රදේශ, මුහුදු නමින් හැඳින්වේ. නිදසුන් :

- සම්පූර්ණයෙන් ම ගොඩබිමින් වට වූ මුහුදු - කැස්පියන් මුහුද සහ එරල් මුහුද
- අර්ධ වශයෙන් ගොඩබිම්වලින් වට වූ මුහුදු - මධ්‍යධරණී මුහුද, රතුමුහුද, කළු මුහුද, කහ මුහුද, ජපන් මුහුද, බෝල්ටික් මුහුද
- සාගරයට සම්බන්ධ ව සාගරයේ ම පිහිටි මුහුදු - අරාබි මුහුද, චීන මුහුද

ලෝකයේ මුහුදු කිහිපයක් 2.2 සිතියමෙන් දක්වා ඇත. සිතියම නිරීක්ෂණය කොට එම මුහුදු හඳුනාගන්න.

ක්‍රියාකාරකම්

1. ලෝක ආකෘති සිතියමක සාගර පහ, මුහුදු දහයක් සහ සාගර අගාධ තුනක් ලකුණු කර නම් කරන්න.
2. සාගර හා මුහුදු මිනිසා විසින් සම්පතක් ලෙස ප්‍රයෝජනයට ගන්නා අවස්ථා මොනවාදැයි පැහැදිලි කරන්න.



2.2 සිතියම

සාගර සහ මුහුදු

පැවරුම

සාගර දූෂණයට හේතු වන මානුෂ ක්‍රියාකාරකම් පිළිබඳ ව තොරතුරු සොයා ලේඛනයක් සකස් කර ඒවා අවම කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

කඳුවැටි (Mountain ranges)

මුදුන් කිහිපයක් සහිත විවිධ බෑවුම්වලින් සහ ඉහළ උන්නතාංශයකින් යුක්ත එක දිගට විහිදෙන භූ රූප, කඳුවැටි නම් වේ. කඳුවැටි ගණනාවක් විශාල ප්‍රදේශයක පැතිරී ඇති විට එය කඳු පද්ධතියක් ලෙස හැඳින්වේ. හිමාලයා, රොකී, අන්දීස් විශාල කඳු පද්ධතිවලට නිදසුන් ය. ලෝකයේ විශාලතම කඳුවැටි කිහිපයක් 2.3 සිතියමෙහි දැක්වේ.

2.3 රූපය
රොකී කඳුවැටිය

මූලාශ්‍රය - *http://portfolios.chuckhaney.com*

2.4 රූපය
හිමාලයා කඳු පද්ධතිය - ගුවන් ඡායාරූපයකි

මූලාශ්‍රය - *http://blogs.oregonstate.edu*

සානු (Plateaus)

කඳුකර ප්‍රදේශයක පිහිටි උස් සම භූමි ප්‍රදේශ සානු නම් වේ. හිමාලයා කඳු පන්තියේ ඇති ටිබෙට් සානුව මුහුදු මට්ටමේ සිට වඩාත් උසින් පිහිටා ඇත. පාමීර් සානුව, මොංගෝලියානු සානුව, ඩෙකෑන් සානුව, අරාබි සානුව යනාදිය ලෝකයේ පිහිටි වෙනත් විශාල සානුවලට නිදසුන් වේ. ශ්‍රී ලංකාවේ ද කුඩා සානු දක්නට ලැබේ. වැලිමඩ සානුව, මහවල තැන්න, කොස්ලන්ද, හැටන් සානුව නිදසුන් ලෙස දැක්විය හැකි ය. ලෝකයේ පිහිටා ඇති සානු කිහිපයක් 2.3 සිතියමෙහි දැක්වේ.

2.5 රූපය
ටිබෙට් සානුව

මූලාශ්‍රය - *http://static.panoramio.com*



2.3 සිතියම

ලෝකයේ කඳුවැටි, සානු, හා තැනිතලා කිහිපයක්

තැනිතලා (Plains)

උන්නතාංශය අඩු විශාල ප්‍රදේශයක පැතිරී ඇති සමතල බිම් තැනිතලා යනුවෙන් හැඳින්වේ. මහා සයිබීරියානු තැනිතලාව, උතුරු ඇමරිකානු තැනිතලාව, ඕස්ට්‍රේලියාවේ නල්ලබාර් තැන්න නිදසුන් ලෙස දැක්විය හැකි ය. (2.3 සිතියම බලන්න.) ඇතැම් විට එම තැනිතලා, මද රැළිගැන්මක් සහිත ය. උස් කඳුකර ප්‍රදේශවලට වඩා තැනිතලා බිම් විවිධ මානුෂ කටයුතු සඳහා යොදාගෙන ඇත. පිහිටීම හෝ නිර්මාණය වී ඇති ආකාරය අනුව විශේෂිත නම්වලින් හැඳින්වෙන තැනි බිම් ද දක්නට ලැබේ. වෙරළබඩ තැන්න (coastal plain), ග්ලැසියර් තැන්න (glacier plain), ගංගා තැන්න (fluvial plain), දියළු තැන්න (alluvial plain) ඒවාට නිදසුන් වේ.

2.6 රූපය
උතුරු ඇමරිකානු මහා තැන්න

මූලාශ්‍රය - *www.wikipedia.com*

2.7 රූපය
ඕස්ට්‍රේලියාවේ නල්ලබාර් තැන්න

මූලාශ්‍රය - *www.crikey-adventure-tours.com*

ක්‍රියාකාරකම්

1. ලෝක ආකෘති සිතියමක ලෝකයේ විශාලතම කඳුවැටි, ප්‍රධාන සානු සහ තැනිතලා තුන බැගින් ලකුණු කර නම් කරන්න.
2. ලෝකයේ මුහුදු මට්ටමේ සිට වඩාත් උසින් ම පිහිටි සානුව කුමක් ද?
3. කඳුකර සහ තැනිතලා ප්‍රදේශ ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරකම් තුන බැගින් ලියන්න.

පැවරුම

සිතියම් පොතක් නිරීක්ෂණය කර එක් එක් මහාද්වීපවල (ඇන්ටාක්ටිකාව හැර) පිහිටා ඇති ප්‍රධාන කඳුවැටි, තැනිතලා හා සානු තුන බැගින් හඳුනාගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

මහාද්වීපය	කඳුවැටි	සානු	තැනිතලා
1	1.......... 2.......... 3...........	1.......... 2.......... 3...........	1.......... 2.......... 3...........
2	1.......... 2.......... 3...........	1.......... 2.......... 3...........	1.......... 2.......... 3...........
3	1.......... 2.......... 3...........	1.......... 2.......... 3...........	1.......... 2.......... 3...........
4	1.......... 2.......... 3...........	1.......... 2.......... 3...........	1.......... 2.......... 3...........
5	1.......... 2.......... 3...........	1.......... 2.......... 3...........	1.......... 2.......... 3...........
6	1.......... 2.......... 3...........	1.......... 2.......... 3...........	1.......... 2.......... 3...........

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ගංගා (Rivers)

වර්ෂය පුරා අඛණ්ඩ ව පැහැදිලි නිම්නයක් (valley) ඔස්සේ මුහුදකට, විලකට, ද්‍රෝණියකට (basin) හෝ වගුරකට (marsh) ගලා බසින ජල ධාරාවක් (water course) ගංගාව නමින් හැඳින්වේ. උස් ප්‍රදේශයකින් ආරම්භ වන ගංගාව භූමියේ බෑවුමට අනුගත ව ගලා බසියි. ලෝකයේ ප්‍රධාන ගංගා කිහිපයක් 2.4 සිතියමෙහි දැක්වේ. ගංගාවක ආරම්භය විවිධ වේ. ඇතැම් ගංගා කඳුකර ප්‍රදේශයකින් ආරම්භ වන අතර තවත් ගංගාවක් උල්පතකින් හෝ විලකින් ආරම්භ විය හැකි ය.

නිදසුන් -

තේම්ස් ගඟ - උල්පතකින් (spring)

නයිල් ගඟ - විලකින්

රයින් ගඟ - ග්ලැසියර දියවූ ජලයෙන්

මහවැලි ගඟ - කඳුකර ප්‍රදේශයක උල්පතකින්

2.8 රූපය

මහවැලි ගඟ

මූලාශ්‍රය - *http://upload.wikimedia.org*

විල් (Lakes)

ගොඩබිම පිහිටි ජලය පිරි ආවාට (craters) 'විල්' නමින් හැඳින්වේ. ලෝකයේ සෑම මහාද්වීපයක ම වාගේ විල් දක්නට ඇත. ආසියාවේ බයිකල් විල, උතුරු ඇමරිකාවේ පංචමහා විල්, ඕස්ට්‍රේලියාවේ අයර් විල, යුරෝපයේ ලැඩෝගා විල, දකුණු ඇමරිකාවේ ටිටිකාකා විල, අප්‍රිකාවේ වික්ටෝරියා විල නිදසුන් ලෙස දැක්විය හැකි ය. ඇතැම් විල් කරදියෙන් යුතු විශාල ජලාශ වන අතර ඒවා අභ්‍යන්තර මුහුදු ලෙස සැලකේ. සුපීරියර් විල ලෝකයේ විශාලතම විල යි. ටිටිකාකා විල ලෝකයේ උස ම ස්ථානයක පිහිටි විල වේ. ලෝකයේ පිහිටි විල් කිහිපයක් 2.4 සිතියමෙන් දැක්වේ.

ක්‍රියාකාරකම්

1. ලෝක ආකෘති සිතියමක ගංගා දහයක් සහ විල් පහක් ලකුණු කර නම් කරන්න. (ඇන්ටාක්ටිකාව හැර අනෙක් සියලු මහාද්වීපවලින් ඒවා තෝරා ගන්න).
2. ගංගා සහ විල් මානුෂ ක්‍රියාකාරකම්වල දී වැදගත් වන ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

පැවරුම

2.4 සිතියම නිරීක්ෂණය කොට එක් එක් මහාද්වීපවල පිහිටා ඇති ගංගා සහ විල් ඇතුළත් ලේඛනයක් සකස් කරන්න.

2.4 සිතියම
ලෝකයේ ප්‍රධාන ගංගා සහ විල්

දේශගුණ වර්ග ව්‍යාප්තිය හා මූලික ලක්ෂණ

දීර්ඝ කාලයක් තුළ පවත්නා වායුගෝලීය සාමාන්‍ය තත්ත්වය දේශගුණය (climate) නම් වේ. මෙම සාමාන්‍ය තත්ත්වය පිළිබඳ පැහැදිලි අදහසක් ලබාගැනීම සඳහා අවම වශයෙන් වසර 30ක හෝ 35ක කාලයක් තුළ කාලගුණ දත්ත අධ්‍යයනය කළ යුතු ය.

දීර්ඝ කාලයක් තුළ එක් එක් භූගෝලීය ප්‍රදේශයන්හි පවතින දේශගුණ තත්ත්වයන් අනුව ලෝකයේ විවිධ දේශගුණ වර්ග හඳුනාගෙන තිබේ. දේශගුණ වර්ගයක් තීරණය වීම කෙරෙහි එම ප්‍රදේශයේ උෂ්ණත්වය, වර්ෂාපතනය, වර්ෂාපතනය ලැබෙන ක්‍රම, වර්ෂාපතනය ලැබෙන කාල සීමාව වැනි සාධක ද වැදගත් වේ.

ලෝකයේ දේශගුණ ව්‍යාප්තිය පිළිබඳ ව මුල් ම අදහසක් ඉදිරිපත් කරනු ලැබුවේ ක්‍රි.පූ.384 දී පමණ ග්‍රීක ජාතික දර්ශනිකයකු වන ඇරිස්ටෝටල් විසිනි. ඔහු පෘථිවිය පුළුල් දේශගුණ කලාප තුනකට බෙදා දැක්වීය. මේ සඳහා මූලික ව ම පදනම් කරගෙන ඇත්තේ ලෝකයේ අක්ෂාංශීය වශයෙන් වෙනස් වන උෂ්ණත්ව ව්‍යාප්තිය යි. පසුකාලීන ව ඔස්ටින් මිලර්, තෝන්ත්වේට්, කෙපන් වැනි අය ලෝක මට්ටමින් පුළුල් දේශගුණ වර්ගීකරණ (climatic classifications) ඉදිරිපත් කර ඇත. ප්‍රධාන දේශගුණ කලාප තුළ දක්නට ලැබෙන විශේෂ දේශගුණ ලක්ෂණ පදනම් කරගෙන උප දේශගුණ වර්ග නම් කර තිබේ.

ලෝකයේ අක්ෂාංශීය උෂ්ණත්ව ව්‍යාප්තිය පදනම් කරගත් ප්‍රධාන දේශගුණ කලාප තුන පිළිබඳ ව පමණක් මෙහි දී අවධානය යොමු කෙරේ.

ප්‍රධාන දේශගුණික කලාප,

1. නිවර්තන කලාපය (Tropical zone)
2. සෞම්‍ය කලාපය (Temperate zone)
3. ශීත කලාපය (Frigid zone) (2.9 රූපය සහ 2.5 සිතියම බලන්න.)



2.9 රූපය
ලෝකයේ ප්‍රධාන දේශගුණ කලාප



2.5 සිතියම

ලෝකයේ ප්‍රධාන දේශගුණ කලාප

නිවර්තන දේශගුණය

කර්කටක නිවර්තනයත් (උතුරු අක්ෂාංශ $23\frac{1}{2}^0$) මකර නිවර්තනයත් (දකුණු අක්ෂාංශ $23\frac{1}{2}^0$) අතර කලාපය නිවර්තන කලාපය ලෙස හැඳින්වේ. මෙම කලාපය සාමාන්‍යයෙන් පෘථිවියේ උෂ්ණත්වය අධිකතම කලාපය වන අතර අවුරුද්ද මුළුල්ලේ ම ඉතා ඉහළ උෂ්ණත්වයක් පවතී (18^0Cට වැඩි). ශීත ඍතුවක් නැත. මේ නිසා උෂ්ණ දේශගුණික තත්ත්වයන් දක්නට ඇත.

මෙම කලාපයේ බොහෝ ප්‍රදේශවල අවුරුද්ද පුරා පැතිරුණු අධික වර්ෂාපතනයක් දක්නට ලැබේ. ඇමර්සන්, කොංගෝ වැනි විශාල වනාන්තර ප්‍රදේශයන් ද සහරා, අරාබි, තාර්, මහා ඕස්ට්‍රේලියන් වැනි කාන්තාර ප්‍රදේශයන් ද විශාල තෘණ භූමි ප්‍රදේශ ද මෙම කලාපය තුළ ව්‍යාප්ත ව පවතී. ඊට හේතුව මෙම කලාපයට ලැබෙන වර්ෂාපතනයේ විවිධත්වය යි. මෙම කලාපයේ ඇති විශේෂිත දේශගුණ වර්ගයක් ලෙස මෝසම් දේශගුණය දැක්විය හැකි ය.

2.10 රූපය
නිවර්තන කලාපීය තෘණ භූමියක්
මූලාශ්‍රය - *http://www.south-africa-tours-and-travel.com*

2.11 රූපය
නිවර්තන කලාපීය වනාන්තරයක්
මූලාශ්‍රය - *http://static.panoramio.com*

2.12 රූපය
නිවර්තන කලාපීය කාන්තාර ප්‍රදේශයක්
මූලාශ්‍රය - *http://toptravellists.net*

සෞම්‍ය දේශගුණය

කර්කටක නිවර්තනයේ (උතුරු අක්ෂාංශ $23\frac{1}{2}^0$) සිට ආක්ටික් වෘත්තය (උතුරු අක්ෂාංශ $66\frac{1}{2}^0$) දක්වා කලාපයත් මකර නිවර්තනයේ (දකුණු අක්ෂාංශ $23\frac{1}{2}^0$) සිට ඇන්ටාක්ටික් වෘත්තය (දකුණු අක්ෂාංශ $66\frac{1}{2}^0$) දක්වා කලාපයත් සෞම්‍ය කලාපය වේ. නිවර්තන කලාපයට වඩා සාමාන්‍ය උෂ්ණත්වය අඩු ය. ඍතු භේදය නිසා උෂ්ණත්වය අඩු වැඩි වේ. පැහැදිලි උණුසුම් ඍතුවක් සහ වර්ෂාපතනය සහිත ශීත ඍතුවක් මෙම කලාපයේ දක්නට ලැබේ. මෙම කලාපයේ දක්නට ඇති විශේෂිත දේශගුණික ලක්ෂණයක් ලෙස මධ්‍යධරණී දේශගුණය හැඳින්විය හැකි ය.



2.13 රූපය
සෞම්‍ය කලාපයේ ස්වාභාවික වෘක්ෂලතා
මූලාශ්‍රය - *http://upload.wikimedia.org*

ශීත දේශගුණය

ආක්ටික් වෘත්තයේ (උතුරු අක්ෂාංශ $66\frac{1}{2}^0$) සිට උත්තරධ්‍රැවය දක්වාත් ඇන්ටාක්ටික් වෘත්තයේ (දකුණු අක්ෂාංශ $66\frac{1}{2}^0$) සිට දක්ෂිණධ්‍රැවය දක්වාත් විහිදෙන ධ්‍රැවාසන්න ප්‍රදේශවල ශීත දේශගුණය දක්නට ලැබේ. මෙම කලාපය තුළ වාර්ෂික වර්ෂාපතනය 250mm -300mm අතර ඉතා පහළ මට්ටමක පවතී. තුහීන (fog) හා හිමපතනය (snowfall) ශීත කලාපයේ ප්‍රධාන ලක්ෂණය වේ. තුන්ද්‍රා දේශගුණය මෙම කලාපයේ ඇති විශේෂිත දේශගුණයකි.

2.14 රූපය
ශීත දේශගුණික පරිසරයක්

මූලාශ්‍රය - *http://hdw.backgroundswallpapers.info*

2.15 රූපය
ශීත දේශගුණික පරිසරයක ස්වාභාවික වෘක්ෂලතා

මූලාශ්‍රය - *http://cityoftongues.files.wordpress.com*

ක්‍රියාකාරකම්

1. දේශගුණය යනු කුමක්දැයි හඳුන්වන්න.
2. ලෝක දේශගුණ වර්ගීකරණ ඉදිරිපත් කරනු ලැබූ පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න.
3. ලෝකයේ අක්ෂාංශ පදනම් කරගත් ප්‍රධාන දේශගුණ කලාප තුන රූප සටහනකින් දක්වා එක් එක් කලාපයේ ප්‍රධාන ලක්ෂණ දෙක බැගින් ලියන්න.
4. ඔබ ප්‍රදේශයේ දේශගුණය, මානුෂ කටයුතු කෙරෙහි බලපාන ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

පැවරුම

ලෝකයේ ප්‍රධාන දේශගුණ කලාපවල ප්‍රධාන ලක්ෂණ හා මානුෂ කටයුතු පිළිබඳ ව පින්තූර ද ඇතුළත් කරමින් වාර්තාවක් පිළියෙල කරන්න.

ආශ්‍රිත ග්‍රන්ථ සහ මූලාශ්‍ර

- Gabler E Robert, James, F Petersen, Trapsso L Michael (2006), Essentials of Physical Geography, 3rd Edition, USA.
- The Oxford school Atlas (1984), Oxford University Press, London.
- Waugh, David (2000), Geography-An Integrated Approach 3rd edition Scotprint London.
- උපාලි වීරක්කොඩි (1993), භූගෝල විද්‍යා ශබ්දකෝෂය, කර්තෘ ප්‍රකාශන.
- ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, භූගෝල විද්‍යාව, 10 ශ්‍රේණිය (2007), ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, භූගෝල විද්‍යාව, 12 ශ්‍රේණිය (2009), ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.
- තම්බයියාපිල්ලේ ජී.ජී.ආර්. සිල්වා එම්.සී.ද (2009), භෞතික භූගෝල විද්‍යාව, 6 වන මුද්‍රණය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
- පාරිසරික භූගෝල විද්‍යාව (1996), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
- භූගෝල විද්‍යා තොරතුරු, 9 වන කලාපය (1996 ජනවාරි), ශ්‍රී ලංකා භූගෝල විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ.
- භූගෝල විද්‍යාව, 10 ශ්‍රේණිය (2011), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
- භෞතික භූගෝල විද්‍යාව 1 කොටස (2013), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
- www.worldatlas.com
- http://www.studyblue.com/notes/note/n/ch-4-ocean-basins/deck/6167301
- http:jwilson.wikidot.com/weekly-lesson-for-april-16
- www.travelphotogallery.net
- www.crikey-adventure-tours.com
- http://portfolios.chuckhaney.com/data/photos/973_1rocky_mtn_front_aerial_002_copy.jpg
- http://blogs.oregonstate.edu/irisgodfrey/files/2013/04/press_2007_large.jpg
- http://upload.wikimedia.org/wikipedia/commons/c/c8/River-nile.JPG
- http://toptravellists.net/wp-content/uploads/2012/05/Oasis-Dakhla-Sahara-Desert-Nature-Egypt.jpg
- http://static.panoramio.com/photos/large/4978777.jpg
- http://www.south-africa-tours-and-travel.com/images/south-african-savannah-marakelenationalparkinsouthafrica.jpg
- http://upload.wikimedia.org/wikipedia/commons/2/2d/Aerial_View_of_Autumn_Forest_Colors.jpg

- http://hdw.backgroundswallpapers.info/0002/nature-landscapes_hdwallpaper_cabin-in-the-tundra_13431.jpg
- http://cityoftongues.files.wordpress.com/2012/12/polar-bear.jpg

පාරිභාෂික වචන

- භූ විෂමතාව - Relief - தரைத்தோற்றம்
- දේශගුණය - Climate - காலநிலை
- මහාද්වීප - Continents - கண்டங்கள்
- සාගර - Oceans - கண்ட மேடை
- මහාද්වීපික තටකය - Continental Shelf - கண்ட சாய்வு
- මහාද්වීපික බෑවුම - Continental Slope - அகழிகள்
- සාගර අගාධ - Trenchs - மலைத்தொடர்
- කඳු පද්ධතිය - Mountain Range - பீடபூமி
- සානුව - Plateau - சமவெளி
- තැනිතලාව - Plain - அயன வலயம்
- නිවර්තන කලාපය - Tropical Zone - இடைவெப்ப வலயம்
- සෞම්‍ය කලාපය - Temperate Zone - முனைவு வலயம்
- ධ්‍රැව/ශීත කලාපය - Polar Zone - கடகக்கோடு
- කර්කටක නිවර්තනය - Tropic of Cancer - மகரக்கோடு
- මකර නිවර්තනය - Tropic of Capricorn - கண்டங்கள்